" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

SLSI ISO 9001 | SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/PTR/2-4/FI/6(E)
ඔබේ අංකය / உமது இலக்கம் / Your No.
දිනය / திகதி / Date 2022.07.

ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය.

ප්‍රධාන ලේකම්,
වයඹ/උතුරු මැද/උතුර/නැගෙනහිර/සබරගමුව/ඌව/මධ්‍යම/දකුණු, පළාත

ලේකම්,
පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය,
බස්නාහිර පළාත.

**බස්නාහිර පළාත් අධ්‍යාපන ,සංස්කෘතික හා කලා කටයුතු,ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශය යටතේ ඇති, හොරණ හා මීගමුව කලාප අධ්‍යාපන කාර්යාලවල පුරප්පාඩුව පවතින ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් කැඳවීම.**

බස්නාහිර පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශය යටතේ ඇති, හොරණ හා මීගමුව කලාප කාර්යාලවල පහත සඳහන් අයුරින් පුරප්පාඩුව පවතින තනතුර සඳහා **සුදුසුකම් සහිත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

| අනු අංකය | තනතුර | ආයතනය | අනුමත ශ්‍රේණිය |
|---|---|---|---|
| 01 | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | කලාප අධ්‍යාපන කාර්යාලය - හොරණ | I ශ්‍රේණිය |
| 02 | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | කලාප අධ්‍යාපන කාර්යාලය - මීගමුව | I ශ්‍රේණිය |

02. **I ශ්‍රේණියේ තනතුරු සඳහා සුදුසුකම් -**

- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකුවීම.
- අයදුම්කරු මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන 2022.08.08 දිනට පූර්වාසන්න වසර 05 තුලදී කිසිදු විනයානුකූල දඬුවමකට යටත් නොවූ අයෙකු විය යුතු අතර, එම වසර 05 තුලදී සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතු ය.
- සෑම අයදුම්කරුවෙකුම තම තනතුරේ සේවය කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

03. තෝරාගනු ලබන ක්‍රමවේදය -

ඉහත 02 ඡේදයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්, බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත පදනම්ව ලකුණු ලබා දෙන අතර, එම ලකුණු මත පදනම්ව ඉහළම ලකුණු ලබා ගත් නිලධාරියා අදාළ තනතුරට තෝරා ගැනීමට කටයුතු කරනු ලැබේ. (අයදුම්පත්‍රය හා ලකුණු ලබාදීමේ ක්‍රමවේදය මේ සමඟ අමුණා ඇත.)

04. නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් තම ආයතන ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියා හා අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කල යුතු වේ.

05. ඒ අනුව, මේ සම්බන්ධයෙන් ඔබ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ කලාප අධ්‍යාපන කාර්යාලයේ හා ඒ යටතේ වන ආයතනයන්හී සේවය කරනු ලබන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සුදුසුකම්ලත් නිලධාරීන් දැනුවත් කර, මේ සමඟ අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව, ඔවුන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් **2022.08.08** දින හෝ ඊට පෙර **applicationptr@gmail.com** දරණ විද්‍යුත් ලිපිනය වෙත යොමු කර, එහි දෘඩ පිටපතක් **2022.08.12 දිනට හෝ ඊට පෙර** " ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය (බස්නාහිර පළාත් සභාව), අංක. 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල යන ලිපිනයට SPEED POST/ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට කටයුතු කරන ලෙස ද දැනුවත් කරන්නේ නම් මැනවි.

06. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතු ය. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, පත් කිරීම සම්බන්ධයෙන් අවසාන තීරණය බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් සතුවේ.

07. එසේම, යම් නිලධාරියෙකු උක්ත තනතුරක් සඳහා තෝරාගනු ලැබුව හොත් එම නිලධාරියා අදාළ පරිපාලන බලධාරියා වෙතින් බස්නාහිර පළාත් සභාව වෙත නිදහස් කරවා ගැනීමට බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් වෙත මැදිහත් විය නොහැකි බවද සැලකුව මැනවි.

ජේ.එම්.සී.ජයන්ති විජේතුංග
ප්‍රධාන ලේකම්
බස්නාහිර පළාත

| |
|---|
| |

කාර්යාල ප්‍රයෝජනය සඳහා

## ආදර්ශ අයදුම් පත්‍රය

.................................................................... පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ

.................................................................... තනතුර සඳහා අයදුම් කිරීම.

01. මුලකුරු සමග නම -

02. සම්පූර්ණ නම -

03. උපන්දිනය -

04. හැඳුනුම්පත් අංකය -

05. පෞද්ගලික ලිපිනය -

06. දුරකථන අංකය -

07. රාජකාරී ලිපිනය -

08. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට පත්වූ දිනය -

09. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට පත්වූ පදනම -

(සාමාන්‍ය සේවක සංඛ්‍යා පදනමද/ විශේෂ සේවක සංඛ්‍යා පදනමද)

09. ශ්‍රී ලං.අ.ප.සේ.II ශ්‍රේණියට උසස් වූ දිනය -

10. ශ්‍රී ලං.අ.ප.සේ.I ශ්‍රේණියට උසස් වූ දිනය -

11. පූර්වාසන්න වසර 05 තුල සියළු වැටුප් වර්ධක උපයාගෙන ඇත/නැත -

12. පූර්වාසන්න වසර 05 තුල කාර්යසාධනය -

(ආයතන ප්‍රධානියා විසින් සහතික කල කාර්යය සාධන වාර්තා වල පිටපත් අමුණා එවිය යුතුය.)

| වසර | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| | | | | |

13.පූර්වාසන්න වසර 5 තුල වැටුප් රහිත නිවාඩු ලබා ගෙන ඇත/නැත -

අ. වැටුප් රහිත නිවාඩු ලබා ගෙන ඇත්නම් ඒ පිළිබඳව විස්තර -

14. (i) වර්තමාන සේවා ස්ථානය -

(ii) දරන තනතුර -

(iii) එම තනතුරට පත්වූ දිනය -

ඉහත සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

දිනය -

.............................................
අයදුම්කරුගේ අත්සන

<u>**ආයතන ප්‍රධානියාගේ සහතිකය -**</u>

.............................................................................. මහතා / මහත්මිය / මෙනවිය සම්බන්ධයෙන් විනය පරීක්ෂණයක් පැවැත්වෙන බව / නොපැවැත්වෙන බව දන්වන අතර, ඔහු / ඇය විසින් සඳහන් කර ඇති තොරතුරු පෞද්ගලික ලිපි ගොනුව අනුව නිවැරදි බව සහතික කරමි. මෙම නිලධාරියා ඉල්ලුම් කර ඇති තනතුර සඳහා තෝරාගනු ලැබුව හොත් දැනට සිටින සේවා ස්ථානයෙන් අනුප්‍රාප්තිකයෙකු සහිතව / රහිතව මුදාහැරීමට එකඟ වෙමි / නොවෙමි.

.............................................
දිනය -
අත්සන හා නිල මුද්‍රාව

<u>**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය -**</u>

ආයතන ප්‍රධානියාගේ නිර්දේශයට එකඟ වෙමි / නොවෙමි.

.............................................
දිනය -
අත්සන හා නිල මුද්‍රාව

<u>**අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය**</u>

ආයතන ප්‍රධානියාගේ / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශයට එකඟ වෙමි / නොවෙමි.

.............................................
දිනය -
අත්සන හා නිල මුද්‍රාව